# කළමනාකරණය හා අලෙවිකරණය

01. i. අ). කළමනාකරණය යනු කුමක්ද?

ආ). ඉලක්ක වෙළඳපල යන්න කුමක් දැයි හඳුන්වන්න.

(ලකුණු 02)

ii.පහත සඳහන් ප්‍රකා සතය/ අසත්‍ය යන්න ලියා දක්වන්න.

අ). අසීමිත සම්පත් කාර්යයක්ෂමව යොදා ගනිමින් ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය වේ . ( )

ආ). ව්‍යාපාරය සැලසුම් කළ කටයුතු ඒ ආකාරයෙන්ම සිදු වී ඇත්දැයි සොයා බැලීම සැලසුම්කරණයයි. ( )

ඉ). නිශ්පාදිතයක් නිර්මාණය කිරීමේ සිට එය පාරිභෝගිකයා අතට පත් කිරීම දක්වා ක්‍රියාවලිය පමණක් අලෙවිකරණය වේ . ( )

ඊ). ව්‍යාපාරයක අලෙවිකරණ පරමාර්ථ ඉටුකර ගැනීමේ දී අලෙවිකරණ මිශ්‍රයේ වැදගත්ම විචල්‍ය වන්නේ ස්ථානයයි. ( )

(ලකුණු 02)

iii. පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා 2018 මාර් 31 වන දින අනුරාධපුරය හා පොළොන්නරුව නැරඹීමට සංවිධායකයන් විසින් තීරණය කරන ලදි. ප්‍රථමාධාර සහ සංග්‍රහ කමිටු සඳහා සිසුන් පත් කරන ලදි. චාරිකාව නිම වූ පසු, එහි ප්‍රගතිය පිළිබඳව විදුහල්පතිතුමා විමසූ අතර, පන්තිභාර ගුරුතුමිය විසින් චාරිකාවේ වාර්තාවද සපයන ලදි.

අ). ඉහත සිද්ධියේ සඳහන් වන කළමනාකරණ කාර්යය දෙකක් සඳහන් කරන්න.

ආ). ඉහත (අ) තුළ සඳහන් එක් එක් කළමනාකරණ කාර්යය සඳහා නිදසුන් බැගින් ලියන්න.

(ලකුණු 02)

iv. පාවහන් නිෂ්පාදනය කරන ආයතනයක්, විශේෂ නම් වර්ගයකින් නිෂ්පාදිත පාවහන් වර්ගයක් හඳුන්වා දීම කොළඹ නගර ශාලාවේ දී 2017.01.01 වන දින සිදු කරන බවත්, එදින කරන මිලදී ගැනීම් සඳහා 50% ක වෙළඳ වට්ටමක් ලබා දෙන බවත් සඳහන් දැන්වීමක් පලකරන ලදි.

අ). ඉහත ආයතනයේ අලෙවිකරණ අරමුණු ඉටුකර ගැනිම සඳහා භාවිත කර ඇති අලෙවිකරණ මිශ්‍රවේ විචල්‍ය දෙකක් ලියා දක්වන්න.

ආ). ඉහත (iv) . (අ) හි ඔබ ලියූ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය දෙක සඳහා මෙම සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න.

(ලකුණු 02)

01.i. අ). 2018 O/L (04).i. අ

ආ).2017 O/L (04).i. අ

ii.අ). 2019 O/L (04).ii. අ

ආ). 2018 O/L (04).ii. අ

ඉ). 2019 O/L (04).ii. ඉ

# කළමනාකරණය හා අලෙවිකරණය

ඊ). 2018 O/L (04). ii. ආ

iii. 2018 O/L (04). iv. ඇ, ආ

iv. 2016 O/L (04). iv. ඇ, ආ